**16. ඉන්ද්‍රිය ප්‍රත්‍යයේ ත්‍රි රාශිය**

සහජාතින්ද්‍රිය ප්‍රත්‍යය ය, පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යය ය, රූප ජීවිතේන්ද්‍රිය ප්‍රත්‍ය යැයි ඉන්ද්‍රිය ප්‍රත්‍යය තෙවැදෑරුම් වේ. එයින් සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයේ ත්‍රි රාශිය මෙසේ ය.

ජීවිතේන්ද්‍රිය චෛතසික ය, චිත්ත ය, වේදනාව ය, ශ්‍රද්ධාව ය, වීර්ය ය, ස්මෘතිය ය, ඒකාග්‍රතාව ය, ප්‍රඥාව ය, යන නාමේන්ද්‍රිය ධර්මයෝ සහජාතින්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ ය.

එකුන්අනූ චිත්ත ය, චෛතසික දෙපණස ය, චිත්තජ රූපය, ප්‍රතිසන්ධි කර්මජ රූපය යන මොවුහු සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

බාහිර රූප ය, ආහාරජ රූප ය, ඍතුජ රූප ය, අසංඥ සත්ත්ව කර්මජ රූප ය, ප්‍රවෘත්ති කර්මජ රූප ය යන මොවුහු සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීකයෝ ය.

---

**ඉන්ද්‍රියපච්චයො** - ඉන්දති - ඊශ්වර වේ, ඉති - එබැවින්, ඉන්ද්‍රියං - ඉන්ද්‍රිය නම් වේ. චක්ඛු ප්‍රසාද රූපය පැහැදිලිව පවතින විට චක්ඛු විඤ්ඤාණය විසින් රූපාරම්මණ මනාව අරමුණු කරනු ලැබේ. දැකීමේ කැමැත්ත කොතරම් බලවත් වුවද චක්ෂු ප්‍රසාදය මනාව නොපැවතුණහොත් දර්ශන කෘත්‍යය දුබල වේ. එබැවින් චක්ඛු ප්‍රසාදයට දර්ශන කෘත්‍යයෙහි ඊශ්වරත්වයක් ඇත. මෙසේ වූ කල්හි තමාට අදාළ වන්නා වූ කෘත්‍යයෙහි තමාගේ අභිමතය ඉටුවන පරිදි ඊශ්වරත්වයක් දක්වන්නා වූ ශක්තිය ඉන්ද්‍රිය ප්‍රත්‍යය නම් වේ. උදහරණයක් ලෙස අමාත්‍යවරුන්ට ස්වකීය විෂයයෙහි ඊශ්වරත්වයක් පැවතීම මෙනි. අදාළ කෘත්‍යයෙහි ඊශ්වරත්වය පිළිබඳව අභිධර්මාර්ථ සංග්‍රහ සමුච්චය කාණ්ඩ භාෂා ටීකාවේ දැක්වීය. අධිපති සහ ඉන්ද්‍රිය ශක්ති විශේෂය පිළිබඳව ද එහි ම අධිපති ධර්මයන් පිළිබඳව විස්තරයේ දී දක්වන ලදී.

**සහජාතින්ද්‍රිය** - තමා හා සමග එක්ව උපදින ධර්මයන්ට ඊශ්වරත්වයක් දක්වන්නා වූ ධර්මයෝ සහජාතින්ද්‍රිය නම් වේ. මේ සඳහා ලැබෙන පරමාර්ථ ධර්ම වනුයේ නාම ඉන්ද්‍රිය ධර්මයන් ය.

**ප්‍රත්‍ය-ප්‍රත්‍යයෝත්පන්න** - ලෝභ මූල ප්‍රථම සිත, චෛතසික සහ චිත්තජ රූප උපදින විට එහි ඇතුළත් වන ජීවිතින්ද්‍රිය ප්‍රත්‍යය වේ.

සෙසු සිත්, චෛතසික චිත්තජ රූප ප්‍රත්‍යයෝත්පන්න වේ. මේ ආදී වශයෙන් වේදනා ප්‍රත්‍යය -පෙ- විරිය ප්‍රත්‍යය -පෙ- ඒකග්‍රතාව ප්‍රත්‍යය -පෙ- සෙසු ලෝභ මූල ප්‍රථම සිත, චෛතසික හා චිත්තජ රූප ප්‍රත්‍යයෝත්පන්න වේ. ශ්‍රද්ධා, සති, ප්‍රඥවෝ ලෝභ මූල සිත සමඟ නො යෙදේ. ඒ ශ්‍රද්ධා, සති, ප්‍රඥව යෙදෙන මහාකුසල සිත් ආදියෙහි ශ්‍රද්ධාදිය ද ප්‍රත්‍යය පැත්තේ ඇතුළත් කළ යුතුය. ප්‍රතිසන්ධි සිත උපදින අවස්ථාවේ ද ප්‍රතිසන්ධි කර්මජ රූපයන් ඇතුලත් කළ යුතුය. අරූප භූමියෙහි පහළ වන විටදී ප්‍රත්‍යයෝත්පන්න සඳහා රූප ඇතුළත් නොවේ.

## පුරේජාතින්ද්‍රිය ත්‍රි රාශිය

අතීත භවාංග චිත්තය හා උපදනා මධ්‍යමායුෂ්ක පඤ්ච ප්‍රසාදයෝ පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ ය. ද්විපඤ්ච විඤ්ඤාණය හා සර්ව චිත්ත සාධාරණ චෛතසික සත පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

ද්විපඤ්ච විඤ්ඤාණයෙන්ගෙන් අන්‍ය වූ එකුන් අසූ චිත්ත ය, චෛතසික දෙපණසය, චිත්තජ රූපය, ප්‍රතිසන්ධි කර්මජ රූප ය, බාහිර රූප ය, ආහාරජ රූප ය, ඍතුජ රූප ය, අසංඥ සත්ත්ව කර්මජ රූප ය, ප්‍රවෘත්ති කර්මජ රූප ය යන මොවුහු පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

--------------------------------------------------------------------

**පුරේජාතින්ද්‍රිය** - චක්ඛුද්වාරික චිත්ත වීථියෙහි චක්ඛු විඤ්ඤාණය චක්ඛු වස්තුව නිශ්‍රය කරගනියි. එම චක්ඛු වස්තුව චක්ඛුවිඤ්ඤාණාදී ප්‍රත්‍යයෝත්පන්න ඉපදීමට පෙර උපදින බැවින් පුරේජාත ප්‍රත්‍යය ද වේ. දර්ශන කෘත්‍යයෙහිදී ඊශ්වරත්වය හේතුවෙන් ඉන්ද්‍රිය ප්‍රත්‍යය ද වේ. එබැවින් මෙහි පුරේජාත ඉන්ද්‍රිය ශක්තිය ඇත. සෝත, ඝාන, ජිව්හා, කාය වස්තූන් ද මෙම ක්‍රමයෙන් දතයුතු වේ. මධ්‍යාමායුෂ්කයෙහි අදහස නිශ්‍රය ප්‍රත්‍යයේ දී කී අයුරින් ගත යුතු වේ. චක්ඛු විඤ්ඤාණය පහළ වීමට පෙර ඉපිද ස්ථිතියට පැමිණි චක්ඛු වස්තුව ප්‍රත්‍යය වේ. චක්ඛු විඤ්ඤාණය සහ සර්වචිත්ත සාධාරණ චෛතසික සත ප්‍රත්‍යයෝත්පන්න වේ. මේ ක්‍රමයෙන් ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න වන ආකාරය දතයුතු වේ.

**රූප ජීවිතින්‍ද්‍රිය ත්‍රි රාශිය**

ජීවිතින්‍ද්‍රිය රූපය, රූප ජීවිතින්‍ද්‍රිය ප්‍රත්‍යය නම් වේ. කර්මජ කලාපයන්හි ජීවිතින්‍ද්‍රියෙන් අන්‍ය රූපයෝ රූප ජීවිතින්‍ද්‍රිය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයේ ය. එකුන්අනූ චිත්ත ය, චෛතසික දෙපනස ය, චිත්තජ රූප ය, බාහිර රූප ය, ආහාරජ රූප ය, සෘතුජ රූප ය, ප්‍රතිසන්ධි කර්මජ, අසංඥ සත්ත්ව කර්මජ, ප්‍රවෘත්ති කර්මජ රූපයන්හි ඇත්තාවූ ජීවිතින්‍ද්‍රිය රූපයෝ ය යන මොහු රූප ජීවිතින්‍ද්‍රිය ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීකයෝ ය.

---

**රූපජීවිතින්‍ද්‍රිය -** ප්‍රවෘත්ති කාලය හෝ වේවා, ප්‍රතිසන්ධි කාලය හෝ වේවා කර්මජ රූප කලාප උපදින සෑම අවස්ථාවක දී ම ජීවිත රූප පවතියි. ඒ ජීවිත රූප සියල්ල තමාගේ කලාපයේ ඇතුලත් කර්මජ රූපයන් රක්‍ෂා කරයි. රක්‍ෂා කරන්නා වූ කෘත්‍යයෙහි ඊශ්වරත්වය පවත්වයි. එබැවින් ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි වශයෙන් ඇති සියලු ජීවිත රූපයන් ඉන්‍ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. එම ජීවිත රූපය සෑම විටක දී ම ප්‍රත්‍යය වීම හේතුවෙන් ප්‍රත්‍යයෝත්පන්නයන්හි ඇතුළත් නොවී ප්‍රත්‍යනීකයන්හි ඇතුලත් වේ. (ප්‍රත්‍යනීකයෙහි "ප්‍රතිසන්ධි කර්මජ අසංඥ සත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයන්හි ඇත්තාවූ ජීවිතේන්‍ද්‍රිය රූපයෝ ය" යැයි දක්වෙනුයේ ඒ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නා වූ ජීවිතින්‍ද්‍රිය යි. ප්‍රතිසන්ධි රූප කලාපවල ඇති ජීවිතින්‍ද්‍රිය, ප්‍රවෘත්ති රූප කලාපවල ඇති ජීවිතින්‍ද්‍රිය ඉන් දක්වුණි.) චක්ඛු දසක කලාපයේ ඇති ජීවිතරූපය ප්‍රත්‍යය වේ. ජීවිත රූපයෙන් අන්‍ය වූ, එම කලාපයේ ඇති කර්මජ රූප නවය ප්‍රත්‍යයෝත්පන්න වේ. සෝත දසකාදී කර්මජ රූප කලාප අටෙහි ද මෙම ක්‍රමයට අනුව ගත යුතු වේ.

**රූපජීවිතින්‍ද්‍රිය වෙන් කොට දැක්වීමට හේතුව -** රූපජීවිතින්‍ද්‍රිය තමා සමඟ උපදින කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන බැවින් සහජාතින්‍ද්‍රියෙහි ඇතුළත් වීමට සුදුසු නො වේ ද? කවර හේතුවක් නිසා වෙන් ව දක්වනා ලද්දේ ද? යනුවෙන් පැනයකි. පිළිතුර වනාහි - ජීවිත රූපය තමා සමඟ ඉපදෙන ඒක කලාපගත කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වූයේ නමුදු නාම ඉන්‍ද්‍රියන් මෙන් උත්පාද ක්ෂණයේදී ප්‍රත්‍යය නොවේ. ඕජාව තමා සමඟ පවතින්නා වූ රූපයන්ට ප්‍රත්‍යය වන්නාක් මෙන් මෙම ජීවිත රූපය ද ස්ථිති ක්ෂණයට පැමිණි පසු අනුපාලක උපස්ථම්භකත්වයෙන් ප්‍රත්‍යය වේ. එබැවින් ජීවිත රූපය සහජාත පුරේජාත යන දෙකෙහි ම ඇතුලත් නොකොට වෙනම දක්වන ලදහ.

අභිධම්මත්ථවිභාවිනී - රූපජීවිතින්ද්‍රියං චෙත්ථ ඕජාවිය ඨිතික්ඛණෙ උපකාරකත්තා සහජාතපච්චයෙසු න ගය්හතීති විසුං වුත්තං

**භාවින්ද්‍රිය දෙක ප්‍රත්‍යය නොවේ -** ලිඞ්ග, නිමිත්ත, කුත්ත, ආකප්පයෝ භාවරූපයන්ගේ ඵලයයි. එබැවින් "ඉත්ථින්ද්‍රිය සහ පුරිසින්ද්‍රිය ඉන්ද්‍රිය ප්‍රත්‍යය වේ, ලිඞ්ගාදිය ඉන්ද්‍රිය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න වේ" යැයි කීමට සුදුසු නො වේ ද යැයි පැනයකි. පිළිතුර නම් - මෙම ඉන්ද්‍රිය ප්‍රත්‍යය අත්ථි ප්‍රත්‍යයෙහි ඇතුලත් වීම හේතුවෙන් ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වුවහොත් අත්ථි ප්‍රත්‍යය ද පැවතිය යුතු වේ. අත්ථි ප්‍රත්‍යය වනාහි ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න දෙක ම උත්පාදයේ දී හෝ ස්ථිතියේ දී හෝ විද්‍යමාන කරවයි. භාවරූපයෝ ප්‍රතිසන්ධි ක්‍ෂණයේදී උපදියි. ඒ ප්‍රතිසන්ධි ක්‍ෂණයේදී ලිඞ්ගාදිය තවමත් පහළ වී නොමැත. මෙසේ භාවරූප පහළ වන අවස්ථාවේදී ලිඞ්ගාදිය තවමත් ප්‍රකටව නොමැති බැවින් අත්ථි ස්වභාවය නොපැමිණි බැවින් භාවරූපයෝ ලිඞ්ගාදීන්ට ඉන්ද්‍රිය ශක්තියෙන් ප්‍රත්‍යය නොවේ.

**චෝදනාව පිණිස -** "ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න විද්‍යමාන වූ කල ම ප්‍රත්‍යය වේ" ය යන්න නිවැරදි නම් භාවදසක කලාපයේ තමා සමඟ උපදින රූප නවයට ද, ඕජාව කලාපයක විද්‍යමාන වන විට රූපයන්ට උපස්ථම්භනය වන්නාක් මෙන් කලාපයක ඇති රූපයන්ට උපස්ථම්භක වශයෙන් ප්‍රත්‍යය විය යුතු වේ ද" යැයි චෝදනාවකි. පිළිතුර නම් තමා සමඟ උපදින රූප නවයට ද වෙනත් කලාපයක උපදුණු රූපයන්ට ද කවර ආකාරයකිනුදු ඊශ්වරත්වයක් නොදක්වන බැවින් තමා හා උපදින රූපයන්ට ද, වෙනත් කලාපය තුළ ඇති රූපයන්ට ද භාවරූපය ප්‍රත්‍යය නො වේ.

මූලටීකා - යස්මා පන භාවදසකෙපි රූපානං ඉත්ථින්ද්‍රියං න ජනකං, නාපි අනුපාලකං උපත්ථම්භකං වා, න ච අඤ්ඤකලාපරූපානං, තස්මා තං ජීවිතින්ද්‍රියං විය සකලාපරූපානං ආහාරො විය වා කලාපන්තරරූපානඤ්ච ඉන්ද්‍රියඅත්ථිඅවිගතපච්චයොති න වුත්තං. එස නයො පුරිසින්ද්‍රියෙපි.

**ඉන්ද්‍රිය ශක්තිය නොමැති වුව ද ඉන්ද්‍රිය නම ලැබීම -** ලිඞ්ගාදීන්ට ප්‍රත්‍යය නොවී, තමා හා උපදනා ධර්මයන්ට ද ප්‍රත්‍ය නොවන්නා වූ මෙම භාවරූප දෙකට කවර හේතුවක් නිසා ඉන්ද්‍රිය යන නම ලැබෙන්නේ ද? පිළිතුර නම් - භාව රූප දෙක ඉන්ද්‍රිය ශක්තියෙන් ප්‍රත්‍යය නොවුණ ද සූත්‍රාන්තික නයෙන් පකතූපනිශ්‍රය ශක්තියෙන් ප්‍රත්‍යය වෙමින් ඊශ්වරත්වයක් පවත්වන බැවින් ඉන්ද්‍රිය යන නාමය ලැබේ. විස්තර කියන්නෙමි - ස්ත්‍රී භාවරූප පහළ වූ සන්තානයක

ඒ භාව රූපයන්ගේ ශක්තියෙන් ලිඞ්ග, නිමිත්ත, කුත්ත, ආකප්ප ආදිය සිහින්ව හා මෘදුව පවතියි. මෙසේ පුරුෂ භාව රූප පහළ වන සන්තානයක ඒ භාව රූපයන්ගේ ශක්තියෙන් ලිඞ්ගාදී එලයන් මහත්ව හා රළුව පවතියි. මෙසේ භාව රූපයන් විසින් "මගේ සන්තානයෙහි ලිඞ්ගාදිය මේ ආකාරයට විය යුතු වේ ය" යනුවෙන් සැලසුම් නොකළ ද සැලසුම් කරන්නාක් මෙන් පවතින බැවින් සූත්‍රාන්තික පකතූපනිශ්‍රය ශක්තියෙන් බලපවත්වන බැවින් ලිඞ්ගාදිය ඊශ්වරත්වයක් ඇති ඉන්‍ද්‍රිය ධර්මය යැයි කියනු ලබයි.